# මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

மகாவலி ,கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சு

**Ministry of Mahaweli, Agriculture, Irrigation and Rural Development**

**(කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / Agriculture Division)**

**80/5 ,"ගොවිජන මන්දිරය",රජමල්වත්ත පටුමග,බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**
80/5, "கொவிஜன மந்திரய",ரஜமல்வத்தை ஒழுங்கை,பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana mandiraya", Rajamalwatta Lane, Battaramulla, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය. எனது இல. My No. | 2/2/1/1/33 | ඔබේ අංකය. உமது இல. Your No. | | දිනය. திகதி. Date. | 2020.06. 21 |

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 01/2020

සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ
ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්/
දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්/ප්‍රධාන කෘෂි විද්‍යාඥයින්/
ප්‍රධාන කෘෂි විශේෂඥයින්,
පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර්/අතිරේක අධ්‍යක්ෂවරුන්/
අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,
ස්ථානභාර නිලධාරීන් /සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්

## ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථාවට අංක 2146/22 හා 2019.10.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුලත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට සහ දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය සංශෝධනය කිරීමට අදාල විධිවිධාන ඇතුලත් කර අංක 2146/22 හා 2019 ඔක්තෝබර් 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථාවේ තුන්වන සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට සේවයේ සිටින ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීම් පහත පරිදි සිදු කරනු ලැබේ.

01. තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම

1.1) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර බඳවා ගෙන ඇති නිලධාරීන් සංශෝධිත ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දිනය හෝ 2019 පෙබරවාරි මස 26 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.


ලේකම් දුරකථන தொலைபேசி Telephone - 011-2879048
செயலாளர் ඊ-මේල් மின்னஞ்சல் e- mail - secretary@agrimin.gov.lk
Secretary ෆැක්ස් தொலைநகல் Fax - 011-2863497
කාර්යාලය දුරකථන தொலைபேசி Telephone - 011-2872093, 011-2872097
அலுவலகம் ඊ-මේල් மின்னஞ்சல் e- mail - info@agrimin.gov.lk
Office ෆැක්ස් தொலைநகல் Fax - 011-2868910

1.2) ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක v යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුල සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් නියමිත දිනට අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

1.3) ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක v යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුල සම්පූර්ණ නොකරනු ලබන නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සහ ඊට අනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අදාළ වේ.

02. දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීම.

2.1) සේවා ව්‍යවස්ථාවේ තුන් වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට පෙර II ශ්‍රේණියේ සිටින නිලධාරීන්ට සහ III වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා පහත කරුණු අදාළ කරගනු ලැබේ.

(අ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1 හි අනු අංක v යටතේ සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර ගැනීම සඳහා මෙම චක්‍රලේඛය ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට වසර පහ (05) ක කාලය ඉක්මවන දිනය දක්වා සහන කාලයක් ලබා දෙනු ලබන අතර එම සහන කාල සීමාව තුල දී පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(ආ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1 හි අනු අංක ii යටතේ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ගැනීම සඳහා II ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනයේ සිට වසර තුන (03) ක සහන කාලයක් ලබා දෙන අතර, එම සහන කාලසීමාව තුල දී අදාළ සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍ර ලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

2.2) සේවා ව්‍යවස්ථාවේ තුන් වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට II ශ්‍රේණියේ සිටින නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේ දී 10.2.1 හි i සහ iv යටතේ සඳහන් කර ඇති සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) II ශ්‍රේණියේ වසර දෙක (02) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා II ශ්‍රේණියට උසස්වීමෙන් පසු වැටුප් වර්ධක දෙක (02) ක් උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව II ශ්‍රේණියට උසස්වීමෙන් පසු උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දෙක (02) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

සටහන:-

2019 පෙබරවාරි මස 26 දිනට පෙර ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II ශ්‍රේණියේ වසර 02කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම විධිවිධාන අනුව එදින සිට I ශ්‍රේණියට උසස් වන නිලධාරීන්ගේ එම වසර 02කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලය I ශ්‍රේණියේ සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

2.3) සේවා ව්‍යවස්ථාවේ තුන් වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට III වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.1 හි දක්වා ඇති විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේ දී 10.2.1 හි i සහ iv යටතේ සඳහන් කර ඇති සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

(අ) III සහ II ශ්‍රේණි වල වසර දොළහ (12) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක එකොළහ (11) ක් උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දොළහ (12) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නිකුත් කරනු ලැබේ.

සුමේධ පෙරේරා ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියු
මේජර් ජනරාල් (විශ්‍රාමික)
ලේකම්
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

සුමේධ පෙරේරා
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියු
මේජර් ජනරාල් (විශ්‍රාමික)
ලේකම්
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ
ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය